**නිවේදනය**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

# <u>2024 වර්ෂයේ රජයේ පාසල්වල</u>
# <u>පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ උපදෙස්</u>

2024 වර්ෂයේ දී රජයේ පාසල්වල පළමුවන ශ්‍රේණියට තම දරුවන් ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන දෙමාපියන්/නිත්‍යානුකූල භාරකරුවන් මෙම නිවේදනයේ දැක්වෙන උපදෙස් අනුව හා ලබා දී ඇති ආකෘති පත්‍රයට අනුව සකස් කළ අයදුම්පත් අදාළ සියලු ලේඛණ සමග තමන්ට අදාළ වන පාසල්වල ප්‍රධානීන් වෙත **2023 අගෝස්තු 18** ට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. **<u>සියලු ම සුදුසුකම් සපුරාලිය යුත්තේ 2023 ජූනි 30 දිනට වලංගු වන පරිදිය.</u>**

අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ යුතු ය.

**2024 වර්ෂයේ දී ................................................................... විද්‍යාලයේ**
**පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍රය**

(ළමයාගේ උප්පැන්න සහතිකයේ පිටපතක් හා තමා ඉල්ලුම් කරනු ලබන ගණය යටතේ, අදාළ වන සියලු ම ලිපි ලේඛනවල පිටපත්, දිව්රුම් ප්‍රකාශයක් මඟින් සහතික කර මෙයට අමුණා එවිය යුතු ය.)

**01. ඉල්ලුම් කරන ගණය :-** .......................................................................................
(ගණ කිහිපයකට අයත් නම් වෙන වෙන ම ඉල්ලුම් කළ යුතු ය.)

**02. ළමයා පිළිබඳ විස්තර :-**

2.1 සම්පූර්ණ නම:- ..............................................................................................
(වාසගමට යටින් ඉරක් අඳින්න)

2.2 මුලකුරු සමඟ නම (සිංහලෙන්) :- ...........................................................
(අගට යෙදෙන එක් නමක් පමණක් ලියන්න. උදා -බී.එස්.එස්. පීරිස්)

2.3 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :- ...........................................................
(අගට යෙදෙන එක් නමක් පමණක් ලියන්න. උදා - B.S.S. PEIRIS)

2.4 ස්ත්‍රී/ පුරුෂ භාවය:- ..............................................................................

2.5 ආගම:- ..............................................................................................

2.6 ඉගෙනුම් මාධ්‍යය (සිංහල/දෙමළ) ..........................................................

2.7 උපන්දිනය:- අවුරුද්ද............. මාසය ............. දිනය .........................

2.8 2024 ජනවාරි මස 31 දිනට වයස : - අවුරුදු ................ මාස ............ දින.........

**03. අයදුම්කරු පිළිබඳ විස්තර :- (මව/ පියා/නිත්‍යානුකූල භාරකරු)**

| | **අයදුම්කරු** | | **කලත්‍රයා** |
|---|---|---|---|
| 3.1 | සම්පූර්ණ නම:-..........................................<br>.............................................................. | 3.2 | සම්පූර්ණ නම:-................................................<br>.............................................................. |
| 3.3 | මුලකුරු සමඟ නම:-..................................<br>.............................................................. | 3.4 | මුලකුරු සමඟ නම:-.......................................<br>.............................................................. |
| 3.5 | ජාතික හැඳුනුම්පත් අංකය:-<br>.............................................................. | 3.6 | ජාතික හැඳුනුම්පත් අංකය:-<br>.............................................................. |
| 3.7 | ශ්‍රී ලාංකිකයෙක් ද:-........................ | 3.8 | ශ්‍රී ලාංකිකයෙක් ද:-......................................... |
| 3.9 | ආගම:-............................................ | 3.10 | ආගම:-....................................................... |

3.11 ස්ථිර ලිපිනය:-...................................
.........................................................

3.12 ස්ථිර ලිපිනය:-...................................................
...........................................................................

3.13 දුරකථන අංකය :-
..........................................................

3.14 දුරකථන අංකය :-
........................................................................

3.15 පදිංචි ව සිටින දිස්ත්‍රික්කය:-
...........................................................

3.16 පදිංචි ව සිටින දිස්ත්‍රික්කය:-
........................................................................

3.17 පදිංචි ස්ථානය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-
.......................................................

3.18 පදිංචි ස්ථානය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-
........................................................................

3.19 පදිංචි ස්ථානයට අදාළ ග්‍රාම නිලධාරී වසම :-..........................................
අංකය :- ......................................

3.20 පදිංචි ස්ථානයට අදාළ ග්‍රාම නිලධාරී වසම :-.......................................
අංකය :- ....................................

**04. ඉල්ලුම් කරන පාසල් (මෙම පාසල ද ඇතුළු ව තම කැමැත්ත අනුපිළිවෙළට ලිවිය යුතු ය.) :-**

| අනු අංකය | පාසලේ නම | පාසල් වර්ගය (ජාතික/ පළාත්) | පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර (මීටර්/කි.මී.) |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |
| 05. | | | |
| 06. | | | |

(ඔබගේ ළමයා ඉල්ලුම් කරන ලද පාසල් කිහිපයකට තේරුණු අවස්ථාවක දී ඔබ විසින් ඉහත සඳහන් කරන ලද ප්‍රමුඛතා අනුපිළිවෙළ සලකා බලා ප්‍රමුඛතාව වැඩි පාසල ලබා දෙනු ලබන අතර, අනෙකුත් පාසල් ලැයිස්තුවලින් නම ඉවත් කරනු ලැබේ.)

05. **ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න දරුවාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල්**

1. ………………………………………………………………………………………………
2. ………………………………………………………………………………………………
3. ………………………………………………………………………………………………
4. ………………………………………………………………………………………………
5. ………………………………………………………………………………………………
6. ………………………………………………………………………………………………
7. ………………………………………………………………………………………………
8. ……………………………………………………………………………………………....
9. ………………………………………………………………………………………………
10. ………………………………………………………………………………………………

**06. ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය**

(පදිංචිය සනාථ කිරීමට අවශ්‍ය ආසන්න හා සහෝදර ගණවලට අදාළ ව මව්පියන්/නිත්‍යානුකූල භාරකරු විසින් ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් විස්තර ලබා ගෙන මෙම කොටස සම්පූර්ණ කර තමන් විසින් ම සහතික කළ යුතු ය.)

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරි වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරි වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරි වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරි වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරි වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

ඉහත තොරතුරු ඡන්ද හිමි නාමලේඛන පරීක්ෂා කර මා විසින් ම නිවැරදි ව සටහන් කර ගත් බව මෙයින් සහතික කරමි.

..................................................... ………………………………….

ඉල්ලුම්කරුගේ අත්සන දිනය

07. පහත සඳහන් කොටස්වල තමා ඉල්ලුම් කරන ගණයට අදාළ කොටස් පමණක් සම්පූර්ණ කරන්න.

| **කරුණු** | **ලකුණු (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)** |
|---|---|
| **7.1 පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්**<br><br>7.1.1 පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය :<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br><br>7.1.2 පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන :<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>7.1.3 ඡන්දහිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරුගේ නම ඇතුළත් ව තිබෙන වසර ගණන : .......................<br><br>ඡන්ද හිමි නාම ලේඛනයේ කලත්‍රයාගේ නම ඇතුළත් ව තිබෙන වසර ගණන : ....................<br>ඡන්දහිමි නාම ලේඛනයේ නිත්‍යානුකූල භාරකරුගේ නම ඇතුළත් ව තිබෙන වසර ගණන : ............................................<br>(අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05ක කාලයක් සඳහා මෙය අදාළ වේ.)<br>අනිවාර්යයෙන් ම අංක 06 සම්පූර්ණ කළ යුතු ය.<br><br>7.1.4 ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න දරුවාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : .................. | |
| **7.2 ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ දරුවන්**<br><br>7.2.1 ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වශයෙන් පාසලේ ඉගෙනුම ලැබූ ශ්‍රේණි සංඛ්‍යාව :.................<br>...............ශ්‍රේණියේ සිට ............................. ශ්‍රේණිය දක්වා<br><br>7.2.2 පාසල් කාලය තුළ ලබා ගත් අධ්‍යාපන ජයග්‍රහණ :<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br><br>7.2.3 පාසල් කාලය තුළ විෂය සමගාමී කටයුතුවලින් ලබා ගත් ජයග්‍රහණ :<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>7.2.4 ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපනික ජයග්‍රහණ හා (විදුහල්පති විසින් නිර්දේශ කරන ලද) පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධ ආකාරයේ සහයෝග :<br>..........................................................................................<br>..........................................................................................<br>.......................................................................................... | |

**7.3 දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර/ සහෝදරියන්**

7.3.1 අයදුම්කරුගේ ළමයෙකු හෝ ළමයින් පාසලේ ඉගෙනුම ලබමින් සිටී නම්

| ළමයාගේ නම | ශ්‍රේණිය හා ඇතුළත්වීමේ අංකය | මෙම පාසලට ඇතුළත් වූ ශ්‍රේණිය | ගත කළ ශ්‍රේණි ගණන |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

7.3.2 පාසලේ සිටින සහෝදර/ සහෝදරියන් පාසලට ලබා දී ඇති ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ඉල්ලුම්කරු ලබා දුන් විවිධාකාරයේ සහයෝග :
..........................................................................................................

7.3.3 පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය :
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................

7.3.4 ඡන්ද හිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරුගේ නම ඇතුළත්ව තිබෙන වසර ගණන : ....................
ඡන්ද හිමි නාම ලේඛනයේ කලත්‍රයාගේ නම ඇතුළත් ව තිබෙන වසර ගණන : ................
ඡන්ද හිමි නාම ලේඛනයේ නීත්‍යානුකූල භාරකරුගේ නම ඇතුළත් ව තිබෙන වසර ගණන : ................
(අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05ක කාලයක් සඳහා මෙය අදාළ වේ.)
අනිවාර්යයෙන් ම අංක 06 සම්පූර්ණ කළ යුතු ය.

7.3.5 ඉල්ලුම් කරනු ලබන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න දරුවා ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : ...............

**7.4 අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන්**

7.4.1 අදාළ ආයතනවල ස්ථිර සේවකයෙකු ලෙස තනතුර හා සේවා කාලය :
..................................................................................................

7.4.2 දැනට දුෂ්කර පාසලක සේවයේ යෙදේ නම් අඛණ්ඩ දුෂ්කර පාසල් සේවා කාලය :
......................................................................................

7.4.3 දුෂ්කර පාසලක සේවයේ යෙදී ඇත්නම් එම සේවා කාලය : ..........................
(දුෂ්කර පාසලක සේවයේ යෙදුන/යෙදෙන කාලසීමාව තුල යම් පහසු පාසලකට අනුයුක්තයක් ලබා ඇත්නම්, එම අනුයුක්ත කාලසීමාව දුෂ්කර සේවා කාලය ගණනය කිරීමේදී සලකා බලනු නොලැබේ).

7.4.4 ලබා නොගත් නිවාඩු දින ගණන :

2022 .....................................
2021 .....................................
2020 .....................................
2019 .....................................
2018 .....................................

| | |
|---|---|
| 7.4.5 ඉල්ලුම් කරන පාසලේ ම සේවයේ යෙදී සිටී නම් එම පාසලේ සේවා කාලය :……………………………………………<br>7.4.6 ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට ඇති දුර (කි.මී) : ......................................................................<br>7.4.7 පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය : ........................................................................................................<br>7.4.8 වර්තමාන සේවා ස්ථානයේ සිට ඉල්ලුම් කරන පාසලට ඇති දුර (කි.මී) :..................... | |
| **7.5 රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම්/රජයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබ පැමිණි නිලධරයන්ගේ දරුවන් :**<br>7.5.1 අවසානයට ස්ථාන මාරුවීම් ලැබ නව සේවා ස්ථානයේ වැඩ භාරගත් දිනය : ............................<br>7.5.2 ස්ථාන මාරුවීමට අදාළ ව, නව සේවා ස්ථානයේ නම සහ ලිපිනය : ........................................................................................................ ........................................................................................................<br>7.5.3 ස්ථාන මාරුවීමෙන් පසු නව පදිංචි ස්ථානයේ ලිපිනය : .......................................................................................................... .........................................................................................................<br>7.5.4 ස්ථාන මාරුවීමට අදාළ ව, පෙර සේවා ස්ථානයේ නම සහ ලිපිනය : ........................................................................................................ ........................................................................................................<br>7.5.5. ස්ථාන මාරුවීමට පෙර පදිංචි ස්ථානයේ ලිපිනය: .......................................................................................................... ..........................................................................................................<br>7.5.6 පෙර සේවා ස්ථානයේ අඛණ්ඩ සේවා කාලය : ....................................... සිට .................................... දක්වා<br>7.5.7 පෙර සේවා ස්ථානය හා ස්ථාන මාරුවීම් ලැබ පැමිණි නව සේවා ස්ථානය අතර දුර (කි.මී): .............................<br>7.5.8 කලත්‍රයා සේවයේ යෙදෙන්නේ නම්, ආසන්න වසර 05ක් තුළ ඔහුගේ/ඇයගේ සේවා ස්ථානයන් පිළිබඳ විස්තර:<br>සේවා ස්ථානයේ නම / ලිපිනය<br>2022 ..……….......................... / ......................................<br>2021 ……….. ......................... / .....................................<br>2020 ……….......................... / .....................................<br>2019 ……….......................... / .....................................<br>2018 ……….......................... / .....................................<br>7.5.9 ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න දරුවාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : ...........................<br>7.5.10 රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු සේවකයෙකු ලෙස සේවා කාලය : ..................<br>7.5.11 ලබා නොගත් නිවාඩු දින ගණන :<br>2022 .....................................<br>2021 .....................................<br>2020 .....................................<br>2019 .....................................<br>2018 ..................................... | |

| | |
|---|---|
| **7.6 ළමයා සමඟ විදේශගතව පදිංචිව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන් :**<br>7.6.1 විදේශගතව සිට නැවත දිවයිනට පැමිණි දිනය : ..........................<br>7.6.2 ළමයා සමඟ අඛණ්ඩ ව විදේශගත ව සිටි කාලසීමාව :<br>............................ දින සිට .............................. දින දක්වා<br>7.6.3 විදේශගත වූ හේතුව :………………………………………..<br>...........................................................................................<br>7.6.4 ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න දරුවාට ඇතුළත්වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව: ...................................... | |

08. ප්‍රකාශය :

මගේ ළමයා ඉගෙනීම පිණිස රජයේ හෝ රජයේ අනුමත පෞද්ගලික හෝ වෙනත් පාසලකට හෝ දැනට නොයන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. පුවත්පතේ පළවන පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ විධිවිධාන හා උපදෙස් හි අංක 01 සිට අංක 12 දක්වා දැක්වෙන කරුණුවලට එකඟ වෙමි. තව ද, මෙහි ඉහතින් සඳහන් කරනු ලැබූ තොරතුරු සත්‍ය බවත්, මවිසින් මෙහි සඳහන් කළ ස්ථිර පදිංචිය හා අනෙකුත් තොරතුරු පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කිරීමට එකඟවන බවත් ප්‍රකාශ කරමි. මවිසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය/කූට බව හෙළි වුවහොත් මාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් මම දනිමි. මාගේ ළමයා පාසලට ඇතුළත් කළ පසු තොරතුරු අසත්‍ය/කූට බව හෙළි වුවහොත් ඔහු/ඇය පාසලෙන් ඉවත් කර ගෙන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කෙරෙන එම ප්‍රදේශයේ වෙනත් පාසලකට ඇතුළත් කිරීමට මම එකඟ වෙමි.

............................ ..........................................................................................

දිනය මවගේ/ පියාගේ/ නිත්‍යානුකූල භාරකරුගේ අත්සන

## පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ විධිවිධාන හා උපදෙස්

**1.0** අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර පහත සඳහන් කර ඇති විධිවිධාන හා තොරතුරු හොඳින් අධ්‍යයනය කළ යුතු ය.

**2.0** **මූලික සුදුසුකම් :**

2.1 2024 ජනවාරි මස 31 දිනට ළමයාගේ වයස අවුරුදු 05 ක් සම්පූර්ණ විය යුතු ය. මේ සඳහා උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතු ය. පාසලේ ඇති පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී නොමැති පාසල්වල පමණක් ළමයෙකුට උප්පැන්න සහතිකය නොමැති නම් ඒ වෙනුවට උපන් දිනය සනාථ කිරීමට උප්පැන්න විවාහ හා මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නිකුත් කරනු ලබන අනුමාන වයස් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. එහෙත්, පසු ව උප්පැන්න සහතිකය නිශ්චිත ව ම ලබා දීමට කටයුතු කළ යුතු ය.

2.2 2024 ජනවාරි 31 දිනට වයස අවුරුදු 06 හෝ 06 ට වැඩි ළමයින් ඇතුළත් කළ හැක්කේ වයස අවුරුදු 06 ට අඩු, සුදුසුකම් සපුරා ඇති ළමයින් සියලු දෙනා ම ඇතුළත් කර ගැනීමෙන් පසුව ය.

**3.0** **අවධානය යොමු කළ යුතු කරුණු : (සියලු ම ගණ සඳහා)**

3.1 පළමුවන ශ්‍රේණියේ සමාන්තර පන්තියක් සඳහා ළමයින් 35 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය මඟින් ද ළමයින් 05 දෙනෙකු ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයින්ගේ ළමයින්ගෙන් ද තෝරා ගනු ලබයි. ඒ අනුව, පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 40කි.

3.2 1960 අංක 05 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) හා 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) යන පනත් අනුව රජයට පවරා ගන්නා ලද පාසල්වල පුරප්පාඩු පිරවීමේ දී පවරා ගන්නා ලද අවස්ථාවේ තත් පාසලේ සිටි ආගමික සිසු අනුපාතය සැළකිල්ලට ගෙන පුරප්පාඩු සංඛ්‍යාව ආගම් අනුව හා එක් එක් ගණ අනුව බෙදා වෙන් කරනු ලැබේ. යම් ආගමක එක් ගණයකට වෙන් කරන ලද ප්‍රමාණයට වඩා අඩු අයදුම්කරුවන් ප්‍රමාණයක් ඉල්ලා ඇති කල්හි එම පුරප්පාඩු එම ආගමට අයත් සෙසු ගණ අතර අනුපාතික ව බෙදා හැරීම සිදු කරයි. යම් ආගමකට අයත් අයදුම්කරුවන් නොමැති විට හෝ අඩුවෙන් සිටින විට හෝ එම පුරප්පාඩු අනුපාතික ව අනෙකුත් ආගම් අතර බෙදා දෙනු ලැබේ.

3.3 මව්පියන් පදිංචිව සිටින්නේ එක ම ස්ථානයක නොවන කල්හි ඔවුන් නීතියෙන් වෙන් නොවූ අය නම් ඒ අය නීතියෙන් වෙන් වීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වූ බව ලිපි ලේඛන මඟින් සනාථ කර ඇති විට ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයගේ (පියා හෝ මව) පදිංචි ස්ථානය, ළමයා පදිංචි ස්ථානය වශයෙන් සලකනු ලැබේ.

3.4 උසාවි තීන්දුවක් මඟින් නීත්‍යානුකූල ව ස්ථිර ව දරුකමට හදා ගැනීම සඳහා පත් කරනු ලැබූ පුද්ගලයෙකු මව හෝ පියා වශයෙන් පිළිගනු ලැබේ. ළමා නිවාසවල සිටින ළමයින්ගේ නීත්‍යානුකූල භාරකරු වශයෙන් නිවාසයේ භාරකරු සැලකේ. නීත්‍යානුකූල ව දරුකමට හදා ගන්නා පුද්ගලයා විසින් ඒ පිළිබඳ උසාවි තීන්දුව අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට පෙර ලබා තිබිය යුතු ය. මව හා පියා දෙදෙනා ම මිය ගොස් ඇති අවස්ථාවක පමණක් ළමයාට රැකවරණය සලසන පුද්ගලයාට එම ළමයාගේ භාරකරු ලෙස ළමයා වෙනුවෙන් ඉල්ලුම් කළ හැකි ය.

3.5 දරුවාගේ මව හා පියා විදේශ ගත ව සිටි අවස්ථාවක දී හෝ දෙමාපියන්ගෙන් එක් අයෙකු ජීවතුන් අතර නොමැති විට සහ අනෙක් පුද්ගලයා විදේශගත ව ඇති විටක නීත්‍යානුකූල ව භාරකාරත්වය පවරා නොතිබුණ ද තාවකාලික ව ළමයාගේ භාරකාරත්වය උසුලන්නාට ළමයාගේ දෙමව්පියන්ගේ නමින් ඉල්ලුම් කළ හැකි ය. එසේ වුව ද ඉහත කරුණුවලට අදාළ වූ ලිපි ලේඛන සලකා බලනු ලබන්නේ දරුවාගේ දෙමාපියන්ට අදාළ ව ය. එසේ ම ළමයාගේ මව/පියා විදේශගත වී සිටීම හෝ ජීවතුන් අතර, නොමැති වීම පිළිබඳ ව අදාළ සහතික මඟින් සනාථ කළ යුතු ය.

3.6 පාසලට අයදුම් කරන මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි වී සිටිය යුතු අතර, අදාළ ග්‍රාම නිලධාරී විසින් පදිංචිය සහතික කළ යුතු ය. පෝෂිත ප්‍රදේශය යනු පාසල පිහිටි පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශය හා පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශ මායිමක යම් පාසලක් පිහිටා ඇති අවස්ථාවක මායිමේ ඇති අනෙක් පරිපාලන දිස්ත්‍රික්කයේ ආසන්න ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වේ. (ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට අදාළ ගණය සඳහා මේ සීමාව බල නො පැවැත්වේ.)

3.7 විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගෙන් අන්තර්කරණය යටතේ අධ්‍යාපනය ලැබීමට සුදුසු බවට අදාල කලාප අධ්‍යාපන කාර්යාල මඟින් තහවුරු කර ඇති දරුවන් පාසල්වල පළමු ශ්‍රේණියට ඇතුළත්කිරීමට චක්‍රලේඛානුකූලව අවශ්‍ය සුදුසුකම් සපුරාලන්නේ නම් එම දරුවන්ද පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන්ට අයදුම්පත් යොමුකළ හැකිය.

## 4.0 අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියා පිළිවෙල:

4.1 ක්‍රියාන්විත රාජකාරී සඳහා ලබා දෙන විශේෂ අනුග්‍රහය යටතේ තම දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ නිලධාරීන් තම අයදුම්පත් අදාළ සේවාවේ සුබසාධක අධ්‍යක්ෂ වෙතින් ලබා ගෙන, විධිමත් ව සම්පූර්ණ කර, ආයතන ප්‍රධානියා මඟින් අදාළ සුබසාධක අධ්‍යක්ෂ වෙත නියමිත දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

4.2 තම දරුවා සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන අනෙකුත් සියලු ම මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් අදාළ පාසලේ විදුහල්පති වෙත 2023 අගෝස්තු 18ට ප්‍රථම ලැබෙන සේ අයදුම්පත සමඟ තම නම, ලිපිනය සඳහන් ලියාපදිංචි තැපෑල සඳහා අවශ්‍ය මුද්දර සහිත ලියුම් කවරයක් ද ළමයා ඇතුළත් කිරීම සඳහා **අවශ්‍ය සුදුසුකම් පිළිබඳ තමන් විසින් ම සහතික කළ, තමන් ඉල්ලුම් කරන ගණයන්ට අදාළ සියලු ම ලිපි ලේඛනවල පිටපත් ද ඒවා සනාථ කිරීමට දිවුරුම් ප්‍රකාශයක් ද සමඟ, ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය.** (විදුලි, ජල සහ දුරකථන බිල්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්, එක් අවුරුද්දකට එක් බිල්පත බැගින් සහ අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට පෙර මාසයේ බිල්පත් ද අමුණා එවිය යුතු ය. එහෙත් සම්මුඛ පරීක්ෂණයේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉල්ලා සිටින පරිදි බිල්පත් ඉදිරිපත් කළ යුතු ය). පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවෙන් අයදුම්පත් ලැබෙන පාසල්වල පමණක් මෙම අයදුම්පත් අතින් වුව ද ගෙනවිත් භාර දිය හැකි අතර, අතින් ගෙනවිත් භාර දෙන්නේ නම් විදුහලින් එම ඉල්ලුම්පත භාර ගත් බවට ලදුපතක් ලබා ගත යුතු ය.

4.3 ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයින්ගේ දරුවන් සෘජු ව ම පාසලට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ නම් අදාළ පාසලේ විදුහල්පති වෙත ද සාමාන්‍ය පටිපාටිය යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.

4.4 මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් එක් පාසලකට ගණ කිහිපයක් යටතේ ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ නම් එම එක් එක් ගණයට වෙන වෙන ම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලි ව අදාළ ගණය ලියා එවිය යුතු ය. (අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින වන විට අයදුම්කරු අදාළ ගණය යටතේ සුදුසුකම් ලබා තිබිය යුතු ය. )

4.5 සෑම අයදුම්කරුවෙකු ම **අවම වශයෙන් තමාට ආසන්න පළාත් සභා පාසල් 03ක් ද ඇතුළු ව පාසල්, 06කටවත් ඉල්ලුම්** කිරීම අනිවාර්ය වේ. පාසල් නම් කිරීමේ දී සෑම ඉල්ලුම්පත්‍රයක ම එම පාසල් ප්‍රමුඛතා අනුපිළිවෙලින් සඳහන් කළ යුතු ය. එසේ ම පාසල් 06කට ඉල්ලුම් කර එම පාසල්වලින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඒ සඳහා සහභාගී නොවන අයදුම්කරුවන් හා අයදුම් නොකළ දෙමාපියන්, නිත්‍යානුකූල භාරකරුවන් පාසලක් නොලැබීම සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ය. එම අභියාචනා සැලකිල්ලට ගෙන ඔහු/ඇය විසින් නම් කරනු ලබන පාසලකට තම ළමයා ඇතුළත් කළ යුතු ය.

4.6 සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙන් ම ඉගැන්වීම් කටයුතු කරන පාසල් සඳහා අයදුම් කරන්නේ නම්, එම පාසල් සඳහා එක් භාෂා මාධ්‍යයකින් පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකි ය. ඉල්ලුම් කරන ලද මාධ්‍යයෙන් පාසලට තෝරා ගනු ලැබුවහොත් ඉන්පසු එම මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

## 5.0 තෝරා ගැනීමේ කාර්ය පටිපාටිය

5.1 නියමිත දිනට ලැබූ අයදුම්පත් සංඛ්‍යාව පාසලේ පළමුවන ශ්‍රේණියට පාසල මඟින් තෝරා ඇතුළත් කර ගත හැකි ළමයින් සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ළමයින් තෝරා ගැනීම කරනු ඇත.

5.2 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්පත් පරීක්ෂා කර, පහත සඳහන් කර ඇති ලකුණු ක්‍රමයට අනුව ලකුණු ලබා දෙනු ඇත. ඉන් අනතුරුව එම ලකුණු ප්‍රමුඛතා අනුව පාසලට සම්මුඛ පරීක්ෂණය මඟින් ඇතුළත් කර ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව මෙන් සිව් ගුණයක් තෝරා ගෙන එම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ඇත.

5.3 පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සිව් ගුණයක් තුළ අයදුම්කරුවන් ඇතුළත් නොවන්නේ නම් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් නොකෙරේ. එහෙත් මේ සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවීමේ හේතු පැහැදිලි ව ම සඳහන් කර ලිඛිතව ම සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට පෙර අයදුම්කරුවන්ට දැන්වීමට විදුහල්පති විසින් කටයුතු කරනු ඇත.

5.4 සුදුසුකම් තිබියදීත් තම දරුවාගේ ඉල්ලුම්පත්‍රය සිව් ගුණයට නොගෙන ප්‍රතික්ෂේප වී ඇත් නම් පමණක්, අදාළ ලිපි ලේඛන සහිත ව (පෙර අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කරනු ලැබූ ලේඛන) නැවත ඉල්ලුම්පත්‍රයක් හා ලකුණු සනාථ කිරීම සඳහා තර්කානුකූල ව ඉදිරිපත් කරන තොරතුරු ඇතුළත් ඉල්ලීමක් ප්‍රතික්ෂේපිත ලිපියේ පිටපතක් සමඟ එම පාසලේ විදුහල්පති වෙත ඉදිරිපත් කළ යුතු ය. ලියුම් කවරයේ වම් කෙළවරේ "පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම - නැවත සලකා බැලීම" ලෙස සඳහන් කර ප්‍රතික්ෂේප ලිපිය ලැබී සතියක් ඇතුළත එවිය යුතු ය.

## 6.0 තෝරා ගැනීම සඳහා උපයෝගී කර ගන්නා ක්‍රමවේදය

(අ) යම් පාසලක පළමුවන ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩුවලින් පාසල මඟින් තෝරා ගන්නා ළමයින් සංඛ්‍යාව මෙහි දැක්වෙන ප්‍රතිශත අනුව පහත සඳහන් ගණවලට අයත් ළමයින් අතරින් තෝරා ගැනේ.

| | | |
|---|---|---|
| I. | පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් | 50% |
| II. | අදාළ පාසලේ ආදි සිසු/ සිසුවියන් වන මව්පියන්ගේ දරුවන් | 25% |
| III. | දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර/ සහෝදරියන් | 14% |
| IV. | අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන් | 06 % |
| V. | රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් / රජයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන් | 04% |
| VI. | ළමයා සමඟ විදේශගතව පදිංචි ව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන් | 01% |

(ආ) එක් එක් ගණ යටතේ සඳහන් කර ඇති ලකුණු ක්‍රමයට අනුව තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දෙනු ඇත. මෙහි දී එම ලකුණු ක්‍රමයට අනුව යම් ගණයක් යටතේ ලබා දිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100 ක් වේ.

(ඇ) අයදුම්කරුවකු විසින් ගණ කිහිපයක් යටතේ ඉල්ලුම්කර ඇති අවස්ථාවකදී, එක් ගණයක් යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවලින් එක් ලේඛනයක් හෝ ව්‍යාජ/කූට ලේඛනයක් බවට සනාථ වන්නේ නම්, එවැනි අවස්ථාවකදී එම අයදුම්කරු විසින් සියලු ගණ යටතේ ඉදිරිපත් කර ඇති අයදුම්පත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කෙරේ.

(ඇ) ඡන්ද හිමි නාම ලේඛනවල ලියාපදිංචි වූ විස්තර සටහන් කර ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රයේ ඉඩකඩ ලබා දී ඇත. තම පදිංචිය සනාථ කිරීම පිණිස ඡන්ද හිමි නාම ලේඛනවල ලියාපදිංචි වූ විස්තර ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන ආසන්න හා සහෝදර ගණවල දෙමාපියන්/ නීත්‍යානුකූල භාරකරුවන් ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් විස්තර ලබා ගෙන මෙම කොටස සම්පූර්ණ කර තමන් විසින් ම සහතික කළ යුතු ය.

(ඉ) පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරන ලද පාසලට ඇති ආසන්නතාව සලකා බැලීමේදී අයදුම්කරුගේ නිවස (ප්‍රධාන දොරටුව) කේන්ද්‍රය කර ගෙන ඉල්ලුම් කරන පාසලේ ප්‍රධාන කාර්යාලයට (ප්‍රාථමික අංශය ප්‍රධාන පාසලින් බැහැර වෙනත් පරිශ්‍රයක පවතින්නේ නම් එම කාර්යාලයට) ඇති (අහස්) දුර අරය ලෙස ගෙන අඳින වෘත්තයක සීමාව තුළට ඇතුළත් වන පාසල් සඳහා ලකුණු අඩු කෙරේ. මෙහි දී ප්‍රධාන පාසලින් බැහැර ව වෙනම පරිශ්‍රයක ප්‍රාථමික අංශය පිහිටා ඇති පාසල් සම්බන්ධයෙන් ලකුණු අඩු කරනුයේ, ප්‍රාථමික අංශය පිහිටි ස්ථානයට වන අතර ද්විතීයික අංශය පිහිටි ස්ථානයට නොවේ.

**යම් පාසලක් ඉහත වෘත්ත සීමාව තුළ පිහිටිය ද ගංගා, කලපු, වගුරුබිම්, රක්ෂිත වනාන්තර ආදී ස්වභාවික බාධාවන් හෝ අධිවේගී මාර්ග පවතින අවස්ථාවලදී පමණක් නිවසේ සිට එම පාසලට ගමන් කල හැකි කෙටිම මාර්ග දුර ඉල්ලුම් කරන පාසලට ඇති කෙටිම මාර්ග දුරට වඩා වැඩි නම් ලකුණු අඩු නොකෙරේ. එහිදී දෙමව්පියන් පිළිගත හැකි සාක්ෂි සහිතව මාර්ග සිතියම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.**

ඉහත අවස්ථාවන්හිදී ආසන්නතාව පරීක්ෂා කිරීම සඳහා රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති පරිමාණය 1:10000 සිතියම භාවිතා කරන අතර, මෙයට අමතරව ගූගල් සිතියම ද (Google Map) සමග සංසන්දනය කර තීරණ ගනු ලැබේ. ඉහත මාර්ග දුර ගණනයේදී ප්‍රායෝගිකව ගැටලු සහගත අවස්ථා විසඳාගැනීම සඳහා සාධාරණ හා පොදු තීරණයක් ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවලට බලතල හිමිවන අතර, අවශ්‍යතාවය මත ස්ථානීය පරීක්ෂණ මඟින් කරුණු සනාථ කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) පදිංචිය සනාථ කිරීමට අදාළ ලිපි ලේඛන, ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ පදිංචි ව සිටින ස්ථානයට අදාළ ව ම තිබිය යුතු ය.

**6.1 පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් - 50%**

(අ) මෙම ගණය යටතේ පෝෂිත ප්‍රදේශය (පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ විධි විධාන හා උපදෙස්හි **3.6** උප වගන්තියට අනුව) තුළ පදිංචි සියලුදෙනාට ම අයදුම් කළ හැකි ය. මෙහි දී පදිංචි වී සිටීම සහ ඒ බව භෞතික ව හා ලිඛිත ව සනාථ කිරීම අනිවාර්ය වේ.

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමයට අනුකූලව ය.

**ලකුණු ක්‍රමය**

**I. පදිංචිය තහවුරු කරන ප්‍රධාන හා අතිරේක ලේඛන**

ඉහත ලේඛන අදාළ පුද්ගලයාගේ නමට පැවරී, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට පූර්ව වසර 05 ක් හෝ ඊට වැඩි කාලයක් හෝ ගත වී ඇත්නම් සම්පූර්ණ ලකුණු ද වසර 05 ට අඩු හා වසර 04 දක්වා කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 80% ක් ද, වසර 04 ට අඩු වසර 03ක් දක්වා කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 60% ක් ද, වසර 03ට වඩා අඩු වසර 02ක් දක්වා කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 40% ක් ද වසර 02ට අඩු එක් වසරක් දක්වා කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 20%ක් ද, එක් වසරකට අඩු මාස 06ක් දක්වා කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 10%ක් ද මාස 06ට අඩු කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 05%ක් ද ලබා දිය යුතු ය.

(අ) පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන

- ✓ සින්නක්කර ඔප්පු
- ✓ බිම්සවිය සහතිකය
- ✓ තෑගි ඔප්පු
- ✓ දීමනා පත්‍ර
- ✓ රජයේ ප්‍රදාන (හිමිකරු මිය ගොස් ඇත්නම් අයදුම්කරු/කලත්‍රයා, අනුප්‍රාප්තිකයකු ලෙස නම් කර තිබිය යුතු අතර, අදාළ බලධාරියා විසින් ඒ බව සනාථ කළ යුතු ය.)
- ✓ විහාර හා දේවාල ගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බදු ඔප්පු හෝ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද අදාළ විහාරාධිපති විසින් නිකුත් කරන සහතික
- ✓ පත් ඉරු මඟින් සනාථ කර ඇති වසර 10කට වැඩි කාලයක් සහිත ප්‍රකාශන ඔප්පු
- ✓ රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයකින් ගෙවීමේ පදනම මත මිල දී ගෙන, සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කර ඇති නමුත් මෙතෙක් අදාළ ආයතන මඟින් එහි හිමිකරු වෙත එම දේපල පවරා නොමැති නිවාස (සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කරන ලද බවට අදාළ ආයතනයෙන් ලබාගත් ලිඛිත තහවුරුවක් ඉදිරිපත් කළ යුතුය.)

(සින්නක්කර ඔප්පු හා තෑගි ඔප්පු ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10 ක් හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතු ය.)

- **ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම තිබේ නම් - ලකුණු 20**
- **ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ හෝ නමට පදිංචි ස්ථානයේ හිමිකම තිබේ නම් - ලකුණු 16**

අදාළ වර්ෂ 05ක කාලය තුළ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ මව/පියා නමින් පැවති හිමිකම අයදුම්කරු හෝ කලත්‍රයා වෙත පවරා ඇත්නම්, ඒ ඒ පාර්ශ්ව වෙත හිමිකම පැවති කාලච්ඡේද දෙකම සැළකිල්ලට ගෙන, ලකුණු ලබා දේ.

(හිමිකම අනෙකුත් අයගේ නමට තිබේ නම් මෙම ලකුණු ලබා නොදේ.)

අවශ්‍ය වන්නේ නම් පත්ඉරු හා දෙවන පිටපත් පරීක්ෂා කර හිමිකම තහවුරු කර ගැනේ.

අයදුම්කරුගේ /කලත්‍රයාගේ නමින් පමණක් ඇති අඛණ්ඩ ව ලියාපදිංචි කළ බදු ඔප්පුව (අවශ්‍ය වන්නේ නම් බදු දීමනාකරුගේ අයිතිය සම්බන්ධව පත්ඉරු මඟින් සනාථ කළ යුතුය.) බදු ඔප්පුව අවම වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජූනි 30 දින සිට ඉදිරි වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, අදාළ දේපල/නිවස සඳහා වෙනම වරිපනම් අංකයක්/ගෘහ අංකයක් තිබිය යුතු ය. /අයදුම්කරුගේ /කලත්‍රයාගේ නමින් පමණක් ඇති රජයේ නිල නිවාස ලේඛනය (දෙපාර්තමේන්තු ප්‍රධානිගේ තහවුරු කිරීමේ ලිපිය), තනිකඩ නිල නිවාසවල පදිංචිකරුවන් අදාළ කර නොගත යුතු ය./ ගෙවල් කුලී පනත යටතේ ලියාපදිංචි වී කුලී නිවැසියන් බව සනාථ කරනු ලබන ලේඛන, අයදුම්කරුගේ/කලත්‍රයාගේ නමින් පමණක් ඇති, රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයකින් ගෙවීමේ පදනම මත මිල දී ගෙන ඇති එහෙත්, ගෙවීම අවසන් කර නොමැති නිවාස ලේඛන (රජයේ/අර්ධ රාජ්‍ය ආයතනයක් සමඟ ඇති කර ගත් විකුණුම් ගිවිසුම් සම්බන්ධයෙන් එම ගිවිසුම හා ගෙවීම් කරන ලද ලදුපත් ද, ඉදිරිපත් කළ යුතුය.)

- ලකුණු 10

අදාළ වර්ෂ 5ක කාලය තුල ලියාපදිංචි බදු ඔප්පු හිමියකු, එම දේපලෙහි හිමිකරුවකු බවට පත්ව ඇත්නම්, ඒ ඒ කාලච්ඡේද වෙන වෙනම සැළකිල්ලට ගෙන අදාළ ප්‍රතිශත අනුව ලකුණු ලබා දේ.මෙහිදී එම ස්ථානයේ පදිංචිය අඛණ්ඩව තිබිය යුතුය.

(ලියාපදිංචි බදු ඔප්පුවක් ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10 ක් හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතු ය.)

- ✓ අයදුම්කරු /කලත්‍රයා අඛණ්ඩ ව වසර 10කට වඩා වැඩි කාලයක් රජයේ ඉඩමක (අදාළ ලිපිනයේ) පදිංචි බවට අදාළ ප්‍රදේශයේ නාගරික කොමසාරිස් /ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික (අදාළ සහතිකය අනෙකුත් අයගේ නමට ඇත්නම් මෙම ලකුණු ලබා නොදේ.) - ලකුණු 05

- ✓ වෙනත් පිළිගත හැකි ලේඛන - ලකුණු 04

පදිංචි ස්ථානයට අදාළ ව ඉහත දක්වා ඇති ලේඛන නොමැති නමුත්, අයදුම්කරු/කලත්‍රයා අදාළ ලිපිනයේ අඛණ්ඩ ව ස්ථිර පදිංචිකරුවකු නම්, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින වන විට පූර්වාසන්න වර්ෂ 06ක් හෝ ඊට වැඩි කාලයක් වූ, පදිංචි ලිපිනය සනාථ කෙරෙන පහත ලේඛන 04ක් සඳහා, එක් ලේඛනයකට අයදුම්කරු හෝ කලත්‍රයා නමින් නම් ලකුණු 01 බැගින් හෝ අයදුම්කරු/ කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමින් නම් ලකුණු 0.5 බැගින් මෙම ලකුණු ලබා දෙනු ලැබේ.

විදුලි බිල්පත්, ජල බිල්පත්, වරිපනම් බදු බිල්පත්, අක්කර බදු බිල්පත්, අයදුම්කරු/කලත්‍රයාගේ උප්පැන්න සහතික

ඉහත ලේඛන අනිවාර්යයෙන් ම පූර්වාසන්න වර්ෂ 06කට හෝ ඊට වැඩි කාලයකට අදාළ විය යුතු අතර එම ලේඛනවලින් අවම වශයෙන් තුනක්වත් තිබේ නම් පමණක් මේ සඳහා ලකුණු ලැබේ.

අදාළ වර්ෂ 06ක කාලය තුළ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ මව/පියා නමින් ගෙවන ලද බිල්පත් පසුව අයදුම්කරු හෝ කලත්‍රයා නමින් ගෙවා ඇත්නම්, ඒ ඒ පාර්ශ්ව විසින් බිල්පත් ගෙවන ලද කාලච්ඡේද දෙකම සැළකිල්ලට ගෙන, ලකුණු ලබා දේ.

- ✓ රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක් සතු දේපලක (ඉල්ලුම් කරන ලද ස්ථානය) උපන්දා සිට පදිංචිව සිටින නමුත්, එම දේපල සඳහා පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනයක් නොමැති අවස්ථාවකදී, එහෙත් කිසිදු ආසන්න පාසලක් සඳහා ලකුණු නොකැපෙන, අයදුම්කරු/කලත්‍රයා ට අදාළ ලිපිනයෙහි පූර්වාසන්න වර්ෂ 5ක ඡන්ද ලියාපදිංචිය ඇති, උපන්දා සිට අයදුම්කරු/කලත්‍රයා අදාළ ස්ථානයේ පදිංචි බවට තහවුරු කළ හැකි (උප්පැන්න සහතිකය, අස්වීම් සහතිකය.......ආදිය මඟින්) විවාහයෙන් පසු ද මේ දක්වා ඉල්ලුම් කරන ලිපිනයේ ම පදිංචිව සිටින බවට තහවුරු කරන අයදුම්කරුවන්ට (එම දේපල රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක් සතු දේපලක් වන බවටත්, අයදුම්කරු එම දේපලෙහි උපන්දා සිට පදිංචිව සිටින බවටත්, ආදාල ආයතන මඟින් කරන ලද තහවුරුවක් අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.) - ලකුණු 15

✓ වතු අධිකාරීවරයෙකු යටතේ පාලනය වන වතුවල කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍යා සේවකයින් පදිංචි කර ඇති විට, ඉහත පදිංචිය තහවුරු කරන කිසිදු අවස්ථාවක් යටතේ සුදුසුකම් සපුරා නොමැති නම්, වතු අධිකාරී විසින් වතු ආශ්‍රිත නිවාසවල පදිංචිය තහවුරු කිරීම සඳහා නිකුත් කර ඇති ලිපිය ග්‍රාම නිලධාරී විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර ඇති අවස්ථාවකදී වෙනත් කිසිදු පාසලකට ලකුණු නොකැපෙන්නේ නම් පමණක්, එවැනි පදිංචිකරුවන් සඳහා

- ලකුණු 15

**(උපරිම ලකුණු 20)**

**මෙම ගණය යටතේ ඉහත කරුණුවලට අදාල ව පදිංචිය තහවුරු කිරීම සඳහා හිමිවන ලකුණු උපයා ඇති අයදුම්කරුවන්ට පමණක් මින් ඉදිරියට ඇති කොටස් සඳහා ලකුණු ලබා දිය යුතු ය.**

**(ආ) පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන**

අයදුම්කරු හෝ කලත්‍රයා නමින් ඇති පහත ලේඛන අතරින් ඕනෑ ම 05ක් සඳහා එක් ලේඛනයකට එක් ලකුණක් බැගින් - ලකුණු 05

ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රය / ස්ථාවර දුරකථන බිල්පත් (රැහැන් සහිත)/ පාසල හැරයාමේ සහතිකය/ විවාහ සහතිකය/ ජීවිත රක්ෂණ හිමිකම් ඔප්පුව/ ළමයාගේ උප්පැන්න සහතිකය/ බැංකු පොත/ වාහන ලියාපදිංචි සහතිකය හෝ වාහන ආදායම් බලපත්‍රය හෝ වාහන රක්ෂණ සහතිකය.

(නේවාසික විදුලි බිල්පත්/ ජල බිල්පත්/ වරිපනම් බදු බිල්පත්/ අක්කර බදු බිල්පත්, පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ වෙනත් පිළිගත හැකි ලේඛනයක් ලෙස ලකුණු උපයා නොමැති නම් පමණක්, පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛනයක් ලෙස යොදාගත හැකිය.)

**(උපරිම ලකුණු 05)**

## II . පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය

ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇති බව සටහන් කිරීමට අයදුම්පතෙහි ලබා දී ඇති කොටස (අංක 06) සම්පූර්ණ කර ලියාපදිංචිය සනාථ කළ යුතු ය.

(අ) ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචියට ලකුණු ලබා දීමේ දී අයදුම් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න පසුගිය වර්ෂ 05ක් (2022-2018) සළකා බලනු ලැබේ.

වගු අංක (I) **ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය සඳහා ලකුණු ලබාදීම.**

| | විස්තරය | ලකුණු |
|---|---|---|
| i. | **මව හා පියා යන දෙදෙනාගේ /නීත්‍යානුකූල භාරකරුගේ** නම වර්ෂ 05 ක් ලියාපදිංචි වී තිබේ නම් හෝ මව/ පියාගේ නම වර්ෂ 5ක් ද, විවාහය ලියාපදිංචි කර වර්ෂයක් ඇතුළත කලත්‍රයාගේ නම ඡන්දහිමි නාම ලේඛනයේ ඇතුළත් කිරීමට අයදුම් කර ඇත්නම් සහ ඉන් අනතුරුව අඛණ්ඩව වර්ෂ 04 ක් කලත්‍රයාගේ නම ද ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී තිබේ නම් | **25** |
| ii. | මව/ පියාගේ නම වර්ෂ 5ක් ද කලත්‍රයාගේ නම ඕනෑ ම වර්ෂ 04ක් ද ලියාපදිංචි වී තිබේ නම් | **22.5** |
| iii. | මව/ පියාගේ නම වර්ෂ 5ක් ද කලත්‍රයාගේ නම ඕනෑ ම වර්ෂ 03ක් | **20** |

| | | |
|---|---|---|
| | ද ලියාපදිංචි වී තිබේ නම් | |
| iv. | මව /පියාගේ නම වර්ෂ 05 ක් ද කලත්‍රයාගේ නම ඕනෑම වර්ෂ 02ක් ද ලියාපදිංචි වී තිබේ නම් | **17.5** |
| v. | මව / පියාගේ නම වර්ෂ 05 ක් ද කලත්‍රයාගේ ගේ නම ඕනෑම වර්ෂයක් ද ලියාපදිංචි වී තිබේ නම් | **15** |
| vi. | මව / පියාගේ නම පමණක් වර්ෂ 05 ක් ලියාපදිංචි වී තිබේ නම් | **12.5** |

සැ.යු -: **එක් අයෙකුට එක් වර්ෂයකට ලකුණු 2.5 බැගින් ලබා දී ඉහත ලකුණු ක්‍රමය සකස් කර ඇත. ඉහත ලකුණු ක්‍රමයෙන් ආවරණය නොවන අවස්ථාවන්හි දී** ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි ව සිටින කාලයට එක් අයෙකුට ලකුණු 2.5 බැගින් වන සේ ලකුණු ලබා දිය යුතු ය.

නීත්‍යානුකූල භාරකරු මව හා පියා යන දෙදෙනාම සේ සලකනු ලබන බැවින්, මව හා පියා යන දෙදෙනාට ම ලියාපදිංචි වර්ෂ සංඛ්‍යාව අනුව හිමි වන ලකුණු (එනම් වර්ෂයකට ලකුණු 05ක්) **නීත්‍යානුකූල භාරකරුට** ලබා දිය යුතු ය.

**(උපරිම ලකුණු 25)**

(ආ) එසේ ම, පෙර වර්ෂවල ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී සිටි ඉල්ලුම්කරුගේ කලත්‍රයා විදේශගතව සිටී නම් හෝ මිය ගොස් ඇත්නම් හෝ නිත්‍යානුකූල ව දික්කසාද වී ඇත්නම් අදාළ ලිපි ලේඛන සැලකිල්ලට ගෙන දෙදෙනා සිටින සේ සලකා ලකුණු ලබා දෙනු ඇත.

(ඇ) පදිංචිය සඳහා ලකුණු ලබා දෙන්නේ දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපි ලේඛන මඟිනි. එහෙත්, දැනට පදිංචි වී සිටින ස්ථානයේ පදිංචි වීමට පෙර පෝෂිත ප්‍රදේශය තුළ තවත් ස්ථානයක පදිංචි වී සිටි අයදුම්කරුවෙකු තම අවම වසර 05ක පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛන ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කරන විට, විට (පෙර පදිංචි ස්ථානයද 6.1.I (අ) හී සඳහන් ලේඛන මඟින් සනාථ කර ගත යුතුය).එම ස්ථාන දෙකෙහි දී ම ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි **පාසල්, එක ම පාසල් වන්නේ නම් පමණක්** ස්ථාන දෙකින් ම ඉදිරිපත් කර ඇති ඡන්ද හිමි නාමලේඛන, දැනට පදිංචි ස්ථානයේ ඡන්ද හිමි නාමලේඛන සේ සලකා ලකුණු ලබා දෙනු ඇත.

(ඈ) අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට පූර්වාසන්න වර්ෂ 05ක් තුළ ක්‍රියාත්මක වූ රජයේ සංවර්ධන ව්‍යාපෘති හෝ සංවර්ධන යෝජනා ක්‍රම හේතුවෙන්, යම් ප්‍රදේශයක පදිංචිකරුවන් එම ප්‍රදේශවලින් ඉවත් කොට වෙනත් ප්‍රදේශයක පදිංචි කරවා ඇති අවස්ථාවක හෝ ඉහත රජයේ සංවර්ධන කටයුතු හේතුවෙන් අවතැන් වූ පදිංචිකරුවන් විසින් රජයෙන් වන්දි මුදල් ලබාගෙන වෙනත් ප්‍රදේශයක ස්ථිර ව පදිංචි වී ඇති අවස්ථාවක, ඔවුන්ගේ දරුවන් පාසල්වල පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීමේ දී පෙර සහ වර්තමාන පදිංචියට අදාළ ව ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කර ඇති ලේඛන, එක ම ස්ථානයකට අදාළ ලේඛන සේ සළකා අදාළ නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ.

### III. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව

ඉල්ලුම්කරුගේ පදිංචිය සනාථ වන්නේ නම් පමණක් ඔහු/ඇය විසින් තමන් දැනට පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ, අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම්, උපරිම ලකුණු ලබා දෙනු ඇත. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න එක් පාසලක් වෙනුවෙන් ලකුණු 05 බැගින් අඩු කරනු ඇත.

(අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට හැකි ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ. එහෙත් ආගමික ප්‍රතිශතයක් අදාළ නොවන පාසල් සඳහා ඕනෑම ආගමක සිසුන්ට ඇතුළත් වීමට හැකිය. )

**(උපරිම ලකුණු 50)**

මෙම ගණය යටතේ අයදුම්කරුගේ පදිංචිය සනාථ නොවන්නේ නම් ලබා දුන් ලකුණු අවලංගු කරනු ඇත.

**6.2 අදාළ පාසලේ ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වන මව්පියන්ගේ දරුවන් - 25%**

(අ) මේ ගණය යටතේ අදාළ පාසලේ ඉගෙනුම ලැබූ ශිෂ්‍යයෙකු/ ශිෂ්‍යාවක වශයෙන් ළමයාගේ මව/පියා/නිත්‍යානුකූල භාරකරුට අයදුම් කළ හැකි ය.

(ආ) ද්විතියික පාසල් සංකල්පය යටතේ මව් පාසලින් ප්‍රාථමික අංශය වෙනම පාසලක් ලෙස වෙන් කර පවත්වා ගෙන යන්නේ නම්, එසේ වෙන් කරන ලද වර්ෂයේ සිට ද්විතියික පාසලේ 6 වන ශ්‍රේණියේ සිට ඉහළට ඉගෙනුම ලැබූ සිසුන් සහ ඒ වනවිට ද්විතියික පාසල හැරගොස් සිටි ආදි සිසුන් අදාළ ප්‍රාථමික පාසලේ ආදි සිසුන් ලෙස සැළකිය හැකි ය.

(ඇ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමය අනුව ය.

I . අයදුම්කරු පාසලේ අධ්‍යාපනය ලැබූ එක් ශ්‍රේණියකට ලකුණු 02 බැගින්. (ශ්‍රේණියක නැවත රැඳීම වෙනුවෙන් ලකුණු ලබා නොදේ.)

**(උපරිම ලකුණු 26)**

II . පාසල් කාලය තුළ අයදුම්කරු විසින් ලබා ගත් අධ්‍යාපනික ජයග්‍රහණ

**(උපරිම ලකුණු 25)**

III . පාසල් කාලය තුළ අයදුම්කරු විසින් විෂය සමගාමී කටයුතුවලින් ලබා ගත් ජයග්‍රහණ

**(උපරිම ලකුණු 25)**

IV ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපනික ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා (විදුහල්පති නිර්දේශ කරන කාර්යයන් සඳහා) ලබා දුන් විවිධ ආකාරයේ සහයෝග (මෙහි දී පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධ ආකාරයේ සහයෝග සඳහා ලබා ගත හැක්කේ උපරිම ලකුණු 06 ක් පමණි.)

**(උපරිම ලකුණු 24)**

සටහන - II, III හා IV හි සඳහන් උපරිම ලකුණු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ එකඟතාව පරිදි ලබා දී ඇති චක්‍රලේඛ උපදෙස්වලට පටහැනි නොවන ආකාරයට බෙදා වෙන් කරනු ලැබේ.

**6.3 දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර සහෝදරියන් - 14%**

(අ) ළමයාගේ මව්පියන්ගේ/නිත්‍යානුකූල භාරකරුගේ වැඩිමහල් ළමයින් දැනටමත් එම පාසලේ ඉගෙනුම ලබමින් සිටී නම් මෙම ගණය යටතේ අයදුම් කළ හැකි ය.

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමය අනුව ය.

**ලකුණු ක්‍රමය**

**I. පාසලේ සිටින සහෝදර/ සහෝදරියන්**

(අ) පාසලේ ගත කළ එක් ශ්‍රේණියක් වෙනුවෙන් ලකුණු 02 බැගින් ලකුණු 20 (පාසලේ ඉගෙනුම ලබන සහෝදර/සහෝදරියන් සංඛ්‍යාව කොපමණ වුව ද ලකුණු ලබා දිය යුත්තේ ඉන් එක් අයෙකු සඳහා පමණි.)

(ආ) අදාළ පාසලේ ඉගෙනුම ලබන ඉහත සඳහන් කළ සහෝදරයා/සහෝදරිය පළමුවන ශ්‍රේණියට ඇතුළත් ව ඉගෙනුම ලබන්නේ නම් (ලකුණු 05)

(ඇ) අදාළ පාසලේ සහෝදරයන්/සහෝදරියන් දෙදෙනෙකු හෝ දෙදෙනෙකුට වඩා ඉගෙනුම ලබන්නේ නම් (ලකුණු 05)

(ඈ) පාසලේ සිටින සහෝදර/සහෝදරියන් පාසලට ලබා දී ඇති ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා දෙමව්පියන් විසින් පාසලට දක්වන ලද විවිධාකාර සහයෝග (පාසලට දක්වන ලද විවිධාකාර සහයෝග සඳහා ලබා ගත හැක්කේ ලකුණු 04 ක් පමණි.) (ලකුණු 10)

**(උපරිම ලකුණු 40)**

**II. පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන**

අදාළ පුද්ගලයාගේ නමට ඇති පදිංචිය තහවුරු කරන ලේඛනය තමා නමින් පැවරී, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට පූර්ව වසර 05 ක් හෝ ඊට වැඩි කාලයක් හෝ ගත වී ඇත්නම් සම්පූර්ණ ලකුණු ද වසර 05 ට අඩු හා වසර 04 දක්වා කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 80% ක් ද, වසර 04 ට අඩු වසර 03ක් දක්වා කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 60% ක් ද, වසර 03ට වඩා අඩු වසර 02ක් දක්වා කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 40% ක් ද වසර 02ට අඩු එක් වසරක් දක්වා කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 20%ක් ද, එක් වසරකට අඩු මාස 06ක් දක්වා කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 10%ක් ද මාස 06ට අඩු කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 05%ක් ද ලබා දෙනු ලැබේ.

- ✓ සින්නක්කර ඔප්පු
- ✓ බිම්සවිය සහතිකය
- ✓ තෑගි ඔප්පු
- ✓ දීමනා පත්‍ර
- ✓ රජයේ ප්‍රදාන (හිමිකරු මිය ගොස් ඇත්නම් අයදුම්කරු/කලත්‍රයා, අනුප්‍රාප්තිකයකු ලෙස නම් කර තිබිය යුතු අතර, අදාළ බලධාරියා විසින් ඒ බව සනාථ කළ යුතු ය.)
- ✓ විහාර හා දේවාල ගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බදු ඔප්පු හෝ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද අදාළ විහාරාධිපති විසින් නිකුත් කරන සහතික
- ✓ පත් ඉරු මඟින් සනාථ කර ඇති වසර 10කට වැඩි කාලයක් සහිත ප්‍රකාශන ඔප්පු

✓ රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයකින් ගෙවීමේ පදනම මත මිල දී ගෙන, සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කර ඇති නමුත් මෙතෙක් අදාළ ආයතන මඟින් එහි හිමිකරු වෙත එම දේපල පවරා නොමැති නිවාස (සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කරන ලද බවට අදාළ ආයතනයෙන් ලබාගත් ලිඛිත තහවුරුවක් ඉදිරිපත් කළ යුතුය.)

(සින්නක්කර ඔප්පු හා තෑගි ඔප්පු ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10 ක් හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතු ය.)

- ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම තිබේ නම් **- ලකුණු 10**
- ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ හෝ නමට පදිංචි ස්ථානයේ හිමිකම තිබේ නම් **- ලකුණු 06**

අදාළ වර්ෂ 05ක කාලය තුළ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ මව/පියා නමින් පැවති හිමිකම අයදුම්කරු හෝ කලත්‍රයා වෙත පවරා ඇත්නම්, ඒ ඒ පාර්ශ්ව වෙත හිමිකම පැවති කාලච්ඡේද දෙකම සැළකිල්ලට ගෙන, ලකුණු ලබා දෙනු ලැබේ.

(හිමිකම අනෙකුත් අයගේ නමට තිබේ නම් මෙම ලකුණු ලබා නොදේ.)

අවශ්‍ය වන්නේ නම් පත්ඉරු හා දෙවන පිටපත් පරීක්ෂා කර හිමිකම තහවුරු කර ගැනේ.

අයදුම්කරුගේ /කලත්‍රයාගේ නමින් පමණක් ඇති අඛණ්ඩ ව ලියාපදිංචි කළ බදු ඔප්පුව, (අවශ්‍ය වන්නේ නම් බදු දීමනාකරුගේ අයිතිය සම්බන්ධව පත්ඉරු මඟින් සනාථ කළ යුතුය.) බදු ඔප්පුව අවම වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට ඉදිරි වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, අදාළ දේපල/නිවස සඳහා වෙනම වරිපනම් අංකයක්/ගෘහ අංකයක් තිබිය යුතු ය./අයදුම්කරුගේ /කලත්‍රයාගේ නමින් පමණක් ඇති රජයේ නිල නිවාස ලේඛනය(දෙපාර්තමේන්තු ප්‍රධානිගේ තහවුරු කිරීමේ ලිපිය) තනිකඩ නිල නිවාසවල පදිංචිකරුවන් අදාළ කර නොගත යුතු ය./ගෙවල් කුලී පනත යටතේ ලියාපදිංචි වී කුලී නිවැසියන් බව සනාථ කරනු ලබන ලේඛන, අයදුම්කරුගේ/කලත්‍රයාගේ නමින් පමණක් ඇති, රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයකින් ගෙවීමේ පදනම මත මිල දී ගෙන ඇති එහෙත්, ගෙවීම අවසන් කර නොමැති නිවාස ලේඛන (රජයේ/අර්ධ රාජ්‍ය ආයතනයක් සමඟ ඇති කර ගත් විකුණුම් ගිවිසුම් සම්බන්ධයෙන් එම ගිවිසුම හා ගෙවීම් කරන ලද ලදුපත් ද, ඉදිරිපත් කළ යුතුය.)

- ලකුණු 04

අදාළ වර්ෂ 5ක කාලය තුල ලියාපදිංචි බදු ඔප්පු හිමියකු, එම දේපලෙහි හිමිකරුවකු බවට පත්ව ඇත්නම්, ඒ ඒ කාලච්ඡේද වෙන වෙනම සැළකිල්ලට ගෙන අදාළ ප්‍රතිශත අනුව ලකුණු ලබා දේ.මෙහිදී එම ස්ථානයේ පදිංචිය අඛණ්ඩව තිබිය යුතුය.

(ලියාපදිංචි බදු ඔප්පුවක් ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10 ක් හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතු ය.)

- ✓ අයදුම්කරු /කලත්‍රයා අඛණ්ඩ ව වසර 10කට වඩා වැඩි කාලයක් රජයේ ඉඩමක (අදාළ ලිපිනයේ) පදිංචි බවට අදාළ ප්‍රදේශයේ නාගරික කොමසාරිස් /ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික (අදාළ සහතිකය අනෙකුත් අයගේ නමට ඇත්නම් මෙම ලකුණු ලබා නොදේ.) - ලකුණු 04

- ✓ වෙනත් පිළිගත හැකි ලේඛන - ලකුණු 02

  පදිංචි ස්ථානයට අදාළ ව ඉහත දක්වා ඇති ලේඛන නොමැති නමුත්, අයදුම්කරු/කලත්‍රයා අදාළ ලිපිනයේ අඛණ්ඩ ව ස්ථිර පදිංචිකරුවකු නම්, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජූනි 30 දින වන විට පූර්වාසන්න වර්ෂ 06ක් හෝ ඊට වැඩි කාලයක් වූ, පදිංචි ලිපිනය සනාථ කෙරෙන පහත ලේඛන 04ක් සඳහා, එක් ලේඛනයකට අයදුම්කරු හෝ කලත්‍රයා නමින් නම් ලකුණු 0.5 බැගින් හෝ අයදුම්කරු/ කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමින් නම් ලකුණු 0.25 බැගින් මෙම ලකුණු ලබා දෙනු ලැබේ.

  විදුලි බිල්පත්, ජල බිල්පත්, වරිපනම් බදු බිල්පත්, අක්කර බදු බිල්පත්, අයදුම්කරු/කලත්‍රයාගේ උප්පැන්න සහතික

  ඉහත ලේඛන අනිවාර්යයෙන් ම පූර්වාසන්න වර්ෂ 06කට හෝ ඊට වැඩි කාලයකට අදාළ විය යුතු අතර එම ලේඛනවලින් අවම වශයෙන් තුනක්වත් තිබේ නම් පමණක් මේ සඳහා ලකුණු ලැබේ.

  අදාළ වර්ෂ 06ක කාලය තුළ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ මව/පියා නමින් ගෙවන ලද බිල්පත් පසුව අයදුම්කරු හෝ කලත්‍රයා නමින් ගෙවා ඇත්නම්, ඒ ඒ පාර්ශ්ව විසින් බිල්පත් ගෙවන ලද කාලච්ඡේද දෙකම සැළකිල්ලට ගෙන, ලකුණු ලබා දේ.

- ✓ රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක් සතු දේපලක (ඉල්ලුම් කරන ලද ස්ථානය) උපන්දා සිට පදිංචිව සිටින නමුත්, එම දේපල සඳහා පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනයක් නොමැති අවස්ථාවකදී, එහෙත් කිසිදු ආසන්න පාසලක් සඳහා ලකුණු නොකැපෙන, අයදුම්කරු/කලත්‍රයා ට අදාළ ලිපිනයෙහි පූර්වාසන්න වර්ෂ 5ක ඡන්ද ලියාපදිංචිය ඇති, උපන්දා සිට අයදුම්කරු/කලත්‍රයා අදාළ ස්ථානයේ පදිංචි බවට තහවුරු කළ හැකි (උප්පැන්න සහතිකය, අස්වීම් සහතිකය.......ආදිය මඟින්) විවාහයෙන් පසු ද මේ දක්වා ඉල්ලුම් කරන ලිපිනයේ ම පදිංචිව සිටින බවට තහවුරු කරන අයදුම්කරුවන්ට (එම දේපල රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක් සතු දේපලක් වන බවටත්, අයදුම්කරු එම දේපලෙහි උපන්දා සිට පදිංචිව සිටින බවටත්, ආදාල ආයතන මඟින් කරන ලද තහවුරුවක් අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.) - ලකුණු 06

- ✓ වතු අධිකාරීවරයෙකු යටතේ පාලනය වන වතුවල කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සේවකයින් පදිංචි කර ඇති විට, ඉහත පදිංචිය තහවුරු කරන කිසිදු අවස්ථාවක් යටතේ සුදුසුකම් සපුරා නොමැති නම්, වතු අධිකාරී විසින් වතු ආශ්‍රිත නිවාසවල පදිංචිය තහවුරු කිරීම සඳහා නිකුත් කර ඇති ලිපිය ග්‍රාම නිලධාරී විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර ඇති අවස්ථාවකදී වෙනත් කිසිදු පාසලකට ලකුණු නොකැපෙන්නේ නම් පමණක්, එවැනි පදිංචිකරුවන් සඳහා - ලකුණු 06

**(උපරිම ලකුණු 10)**

**මෙම ගණය යටතේ ඉහත කරුණුවලට අදාල ව පදිංචිය තහවුරු කිරීම සඳහා හිමිවන ලකුණු උපයා ඇති අයදුම්කරුවන්ට පමණක් මින් ඉදිරියට ඇති කොටස් සඳහා ලකුණු ලබා දිය යුතු ය.**

**III. පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය.**

ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇති බව සටහන් කිරීමට අයදුම්පතෙහි ලබා දී ඇති කොටස (අංක 06) සම්පූර්ණ කර ලියාපදිංචිය සනාථ කළ යුතු ය.

(අ) ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචියට ලකුණු ලබා දීමේ දී අයදුම් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න පසුගිය වර්ෂ 05ක් (2022-2018) සළකා බලනු ලැබේ.

වගු අංක (II) **ඡන්ද හිමි නාමලේඛනයේ ලියා පදිංචිය සඳහා ලකුණු ලබාදීම.**

| | විස්තරය | ලකුණු |
|---|---|---|
| i. | මව හා පියා යන දෙදෙනාගේ /නීත්‍යානුකූල භාරකරුගේ නම වර්ෂ 05 ක් ලියා පදිංචි වී තිබේ නම් | **20** |
| ii. | මව/ පියාගේ නම වර්ෂ 5ක් ද කලත්‍රයාගේ නම ඕනෑ ම වර්ෂ 04ක් ද ලියාපදිංචි වී තිබේ නම් | **18** |
| iii. | මව/ පියාගේ නම වර්ෂ 5ක් ද කලත්‍රයාගේ නම ඕනෑ ම වර්ෂ 03ක් ද ලියාපදිංචි වී තිබේ නම් | **16** |
| iv. | මව /පියාගේ නම වර්ෂ 05 ක් ද කලත්‍රයාගේ නම ඕනෑම වර්ෂ 02ක් ද ලියාපදිංචි වී තිබේ නම් | **14** |
| v. | මව / පියාගේ නම වර්ෂ 05 ක් ද කලත්‍රයාගේ ගේ නම ඕනෑම වර්ෂයක් ද ලියාපදිංචි වී තිබේ නම් | **12** |
| vi. | මව / පියාගේ නම පමණක් වර්ෂ 05 ක් ලියාපදිංචි වී තිබේ නම් | **10** |

**(උපරිම ලකුණු 20)**

සැ.යු -: **එක් අයෙකුට එක් වර්ෂයකට ලකුණු 02 බැගින් ලබා දී ඉහත ලකුණු ක්‍රමය සකස් කර ඇත. ඉහත ලකුණු ක්‍රමයෙන් ආවරණය නොවන අවස්ථාවන්හි දී** ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි ව සිටින කාලයට එක් අයෙකුට ලකුණු 02 බැගින් වන සේ ලකුණු ලබා දිය යුතු ය.

නීත්‍යානුකූල භාරකරු මව හා පියා යන දෙදෙනාම සේ සලකනු ලබන බැවින්, මව හා පියා යන දෙදෙනාට ම ලියාපදිංචි වර්ෂ සංඛ්‍යාව අනුව හිමි වන ලකුණු (එනම් වර්ෂයකට ලකුණු 04ක්) නීත්‍යානුකූල භාරකරුට ලබා දිය යුතු ය.

(ආ) පෙර වර්ෂවල ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී සිටි ඉල්ලුම්කරුගේ කලත්‍රයා විදේශගත ව සිටී නම් හෝ මිය ගොස් ඇත්නම් හෝ නිත්‍යානුකූල ව දික්කසාද වී ඇත්නම් හෝ අදාළ ලේඛන සැලකිල්ලට ගෙන දෙදෙනා ම සිටින සේ සලකා බලා ලකුණු ලබා දෙනු ඇත.

(ඇ) පදිංචිය සඳහා ලකුණු ලබා දෙන්නේ දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපි ලේඛන මඟිනි. එහෙත්, දැනට පදිංචි වී සිටින ස්ථානයේ පදිංචි වීමට පෙර පෝෂිත ප්‍රදේශය තුළ තවත් ස්ථානයක පදිංචි වී සිටි (පෙර පදිංචි ස්ථානයද 6.3 IIහී සඳහන් ලේඛන මඟින් සනාථ කර ගත යුතුය). අයදුම්කරුවෙකු තම අවම වසර 05ක පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛන ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කරන විට, එම ස්ථාන දෙකෙහි දී ම ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි **පාසල්, එක ම පාසල් වන්නේ නම් පමණක්** ස්ථාන දෙකින් ම ඉදිරිපත් කර ඇති ඡන්ද හිමි නාමලේඛන, දැනට පදිංචි ස්ථානයේ ඡන්ද හිමි නාමලේඛන සේ සලකා ලකුණු ලබා දෙනු ඇත.

(ඇ) අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට පූර්වාසන්න වර්ෂ 05ක් තුළ ක්‍රියාත්මක වූ රජයේ සංවර්ධන ව්‍යාපෘති හෝ සංවර්ධන යෝජනා ක්‍රම හේතුවෙන්, යම් ප්‍රදේශයක පදිංචිකරුවන් එම ප්‍රදේශවලින් ඉවත් කොට වෙනත් ප්‍රදේශයක පදිංචි කරවා ඇති අවස්ථාවක හෝ ඉහත රජයේ සංවර්ධන කටයුතු හේතුවෙන් අවතැන් වූ පදිංචිකරුවන් විසින් රජයෙන් වන්දි මුදල් ලබාගෙන වෙනත් ප්‍රදේශයක ස්ථිර ව පදිංචි වී ඇති අවස්ථාවක, ඔවුන්ගේ දරුවන් පාසල්වල පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීමේ දී පෙර සහ වර්තමාන පදිංචියට අදාළ ව ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කර ඇති ලේඛන, එක ම ස්ථානයකට අදාළ ලේඛන සේ සළකා අදාළ නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ.

**IV. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව**

අයදුම්කරු පදිංචි ස්ථානයේ සිට තමන් විසින් ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ තම දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දෙනු ඇත. යම් හෙයකින් ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ තම දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න එක් පාසලක් වෙනුවෙන් ලකුණු 03 බැගින් අඩු කරනු ලැබේ.

(අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට හැකි ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ. එහෙත් ආගමික ප්‍රතිශතයක් සඳහන් නොවන පාසල් සඳහා ඕනෑම ආගමක සිසුන්ට ඇතුළත් වීමට හැකිය.)

**(උපරිම ලකුණු30)**

**6.4 අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන් - 06%**

(අ) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරක මව/ පියා/ නිත්‍යානුකූල භාරකරු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට සේවයේ නියුක්තව සිටී නම් පමණක් මෙම ගණයට ඉල්ලුම් කළ හැකි ය.

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමයට අනුව ය.

**ලකුණු ක්‍රමය**

I අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයන්හි කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවකයෙකු ලෙස සේවා කාලය පූර්ණ වර්ෂයකට ලකුණු 01බැගින්

**(උපරිම ලකුණු 20)**

II දුෂ්කර පාසල් සේවා කාලය (දුෂ්කර පාසල් සේවා කාලය අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කළ යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අති දුෂ්කර හා දුෂ්කර පාසල් ලෙස නම් කරනු ලැබූ චක්‍රලේඛ අනුව)

(අ) දැනට දුෂ්කර පාසලක සේවයේ යෙදේ නම් දුෂ්කර සේවා කාලය (මෙම කාලය අඛණ්ඩ ව තිබිය යුතු යි.) - පූර්ණ වසරකට ලකුණු 05 බැගින් ලකුණු 25

(ආ) දැනට දුෂ්කර පාසලක සේවයේ නොයෙදෙන නමුත් මීට පෙර දුෂ්කර සේවයේ යෙදුණේ නම් සේවා කාලය - පූර්ණ වසරකට ලකුණු 03 බැගින් ලකුණු 15

(දුෂ්කර පාසලක සේවයේ යෙදුන/යෙදෙන කාලසීමාව තුල යම් පහසු පාසලකට අනුයුක්තයක් ලබා ඇත්නම්, එම අනුයුක්ත කාලසීමාව දුෂ්කර සේවා කාලය ගණනය කිරීමේදී සලකා බලනු නොලැබේ).

**(උපරිම ලකුණු 25)**

**සැ.යු -** අවම වශයෙන් වසරකට වඩා වැඩි දුෂ්කර සේවා කාලයක් සපුරා ඇති අයට පමණක් පූර්ණ වසරකට වඩා වැඩි වන මාස හයක් හෝ ඊට වැඩි වන මාස ගණනට අදාළ ලකුණෙන් භාගයක් සඳහා හිමිකම ඇත.

III. ලබා නොගත් නිවාඩු

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයට පෙර වසර 05 ක් සඳහා ලිත් වර්ෂය තුළ ලබා නොගත් නිවාඩු දින 20 ට ලකුණු 02 බැගින්
(වර්ෂයකට ලබා නොගත් නිවාඩු දින 20 ට වඩා අඩු නම් ලකුණු ලබා නොදෙනු ඇත.)

**(උපරිම ලකුණු 10)**

IV දරුවා ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන පාසලේ ම සේවයේ යෙදෙන්නේ නම්

- සේවා කාලය වර්ෂයකට ලකුණු 2 බැගින් වර්ෂ 5ක් සඳහා ලකුණු 10

**(උපරිම ලකුණු 10)**

V පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට ඇති දුර
(කෙටිම, පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කර ගත යුතු ය.)

| | |
|---|---|
| කි.මී. 01ක් ඇතුළත නම් | -ලකුණු 10 |
| කි.මී. 01ට වැඩි කි.මී. 03 දක්වා | -ලකුණු 08 |
| කි.මී. 03ට වැඩි කි.මී. 05 දක්වා | -ලකුණු 06 |
| කි.මී. 05ට වැඩි නම් | -ලකුණු 04 |

ස්ථිර පදිංචි ස්ථානය සනාථ කර ගැනීම සඳහා 6.3 II හි සඳහන් ලේඛන අදාළ කර ගන්නා අතර එහි සඳහන් කාලය සැලකිල්ලට ගෙන ලකුණු ලබා දේ.

**(උපරිම ලකුණු 10)**

VI වර්තමාන සේවා ස්ථානයේ සිට ඉල්ලුම් කරන පාසලට ඇති දුර
**(කෙටිම, පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කර ගත යුතු ය.)**

| | |
|---|---|
| කි.මී.100 හා ඊට වැඩි නම් | - ලකුණු 25 |
| කි.මී.100ට අඩු කි.මී. 70 දක්වා | - ලකුණු 20 |
| කි.මී. 70ට අඩු කි.මී. 40 දක්වා | - ලකුණු 15 |
| කි.මී. 40ට අඩු 20 දක්වා | - ලකුණු 10 |
| කි.මී. 20ට අඩු නම් | - ලකුණු 05 |

**(උපරිම ලකුණු 25)**

**6.5 රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම්/ රජයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන් - 04%**

(අ) මෙම ගණය යටතේ රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබූ හෝ රජයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකුවල නිලධාරීන්ට අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට පෙර වසර 05 ක කාලයක් ඇතුළත පාසල පිහිටි ප්‍රදේශය තුළ ස්ථාපිත ආයතනයකට ස්ථාන මාරුවීම් ලැබ රාජකාරී භාර ගැනීමෙන් පසු ව පාසලේ පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි ව සිටින්නේ නම් පමණක් ඉල්ලුම් කළ හැකිය.

මෙහි දී පාසල පිහිටි ප්‍රදේශය යනුවෙන් අදහස් වන්නේ අදාළ පාසල කේන්ද්‍රය කර කිලෝ මීටර් 10 ක් අරය ලෙස ගෙන අඳින වෘත්තයක සීමාව තුළ අදාළ ආයතනය පිහිටා තිබීම වේ. (අදාළ සීමාව තුළ ප්‍රමාණවත් අයදුම්පත් ලැබී නොමැති නම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට මෙම සීමාව වැඩි කර ගත හැක). එමෙන් ම පෙර සේවා ස්ථානය පිහිටා ඇති ප්‍රදේශයේ කලත්‍රයා හා ළමයා ද සමඟ පදිංචි ව සිට, නව සේවා ස්ථානයට අදාළ පදිංචි ස්ථානයට කලත්‍රයා හා ළමයා සමඟ පැමිණිය යුතු ය. තව ද, අවසානයට ලද ස්ථාන මාරුව පමණක් සලකා බලනු ඇත. එමෙන් ම, අනුයුක්ත කිරීම්, පුහුණු පාඨමාලා හා අධ්‍යයන කටයුතු සඳහා පදිංචිය වෙනස් කිරීම් ආදිය මේ යටතේ සලකා බලනු නොලබන අතර, පෙර සේවා ස්ථානය හා නව සේවා ස්ථානය අතර අවම දුර 50කි.මී.ක් විය යුතු අතර, **අවම වශයෙන් වසරක්වත් පෙර සේවා ස්ථානයේ සේවය කර තිබිය යුතු ය.**

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමය අනුව ය.

**ලකුණු ක්‍රමය**

I. පෙර සේවා ස්ථානයේ සිට ස්ථාන මාරුවීම් ලබා පැමිණ ඇති නව සේවා ස්ථානය අතර දුර (කෙටිම, පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කර ගත යුතු ය.)

| | |
|---|---|
| කි.මී. 150 හා ඊට වැඩි නම් | - ලකුණු 35 |
| කි.මී.150ට අඩු කි.මී. 100 දක්වා | - ලකුණු 28 |
| කි.මී.100ට අඩු කි.මී. 50 දක්වා | - ලකුණු 21 |

**(උපරිම ලකුණු 35)**

II. **පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව**
**(6.3 II හි සඳහන් ලේඛන මඟින් පදිංචිය සනාථ කර ගත යුතු ය.)**

ස්ථාන මාරුවීම් ලැබ පැමිණ පදිංචි වූ ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දෙනු ඇත. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ තම දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශය සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න පාසලක් වෙනුවෙන් ලකුණු 03 බැගින් අඩු කරනු ඇත.

(අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට හැකි ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ. එහෙත් ආගමික ප්‍රතිශතයක් අදාළ නොවන පාසල් සඳහා ඕනෑම ආගමක සිසුන්ට ඇතුළත් වීමට හැකිය.)

**(උපරිම ලකුණු 30)**

III. රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු සේවකයකු ලෙස සේවා කාලය
- වසරකට එක් ලකුණක් බැගින්

**(උපරිම ලකුණු 10)**

IV. පෙර සේවා ස්ථානයේ සේවය කළ කාලය (අවසාන ස්ථාන මාරුවීම ලැබීමට පෙර, සේවය කළ ස්ථානය)

| | | |
|---|---|---|
| වර්ෂ 3 හෝ ඊට වැඩි | - | ලකුණු 10 |
| වර්ෂ 2 සිට වර්ෂ 3ට අඩු | - | ලකුණු 08 |
| වර්ෂ 1 සිට වර්ෂ 2ට අඩු | - | ලකුණු 05 |

**(උපරිම ලකුණු 10)**

V. ස්ථාන මාරුවීම් ලැබ ගත වූ කාලය (අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට)

| | |
|---|---|
| වර්ෂයක කාලයක් තුළ නම් | -ලකුණු 05 |
| වර්ෂයකට වැඩි වර්ෂ 02 දක්වා කාලයක් තුළ නම් | -ලකුණු 04 |
| වර්ෂ 02කට වැඩි වර්ෂ 03 දක්වා කාලයක් තුළ නම් | -ලකුණු 03 |
| වර්ෂ 03කට වැඩි වර්ෂ 04දක්වා කාලයක් තුළ නම් | -ලකුණු 02 |
| වර්ෂ 04කට වැඩි වර්ෂ 05 දක්වා කාලයක් තුළ නම් | -ලකුණු 01 |

**(උපරිම ලකුණු 05)**

VI. ලබා නොගත් නිවාඩු

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයට පෙර වසර 05 ක් සඳහා ලිත් වර්ෂය තුළ ලබා නොගත් නිවාඩු දින20 ට ලකුණු 02 බැගින්

(වර්ෂයකට ලබා නොගත් නිවාඩු දින 20 ට වඩා අඩු නම් ලකුණු ලබා නොදේ.)

**(උපරිම ලකුණු 10)**

**සැ.යු -** පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට පසු හෝ පළමු ශ්‍රේණිය ආරම්භ වීමෙන් පසු හෝ රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබූ හෝ අදාළ දරුවා සමඟ විදේශගතව සිට පැමිණෙන නිලධරයන්ගේ දරුවන්ට පාසල් ලබාදීම සඳහා අදාළ පාසල අයත් වන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට ඉල්ලුම්පත් යොමු කළ යුතු ය. අදාළ අධ්‍යාපන බලධාරීන් විසින් තීරණය කරන ලද පාසල් මෙම දෙමාපියන්ගේ දරුවන් සඳහා ලබා දෙනු ඇත.

**6.6 ළමයා සමඟ විදේශගත ව පදිංචිව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන් - 01%**

(අ) මෙම ගණය යටතේ ළමයා සමඟ විදේශගත ව පදිංචි ව සිට අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයට පෙර වර්ෂයේ ජූලි මස 01 වන දින සිට අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින දක්වා කාලය තුළ මෙරටට පැමිණෙන මව/ පියා/නීත්‍යානුකූල භාරකරුට ඉල්ලුම් කළ හැකිය. එසේ ම ඔවුන් අවම වශයෙන් අඛණ්ඩ ව වර්ෂයකට නොඅඩු කාලයක් විදේශගත ව සිට පැමිණි අය විය යුතු ය.

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමය අනුව ය.

## ලකුණු ක්‍රමය

I. දිවයිනට පැමිණි දිනය දක්වා ළමයා සමඟ විදේශගත වී සිටි කාලය

අඛණ්ඩව වසර 03ක් හෝ ඊට වැඩි කාලයක් - ලකුණු 25
අඛණ්ඩව වසර 03ට අඩු වසර 02 ක් දක්වා කාලයක් - ලකුණු 15
අඛණ්ඩව වසර 02ට අඩු වසර 01ක් දක්වා කාලයක් - ලකුණු 10

**(උපරිම ලකුණු 25)**

(මෙම කාලය තුළ මසකට අඩු කාලයක් නිවාඩු ලබා ලංකාවට පැමිණ නැවතත් අදාළ ස්ථානයට ගොස් ඇත්නම් අඛණ්ඩ කාලය ඛණ්ඩනය නොවන බව සැලකිය යුතු ය. )

II. විදේශගත වූ ස්වභාවය

ශ්‍රී ලංකා දූත මණ්ඩල රාජකාරි සඳහා - ලකුණු 40

පෞද්ගලික රැකියා අවශ්‍යතාවයක් සඳහා - ලකුණු 30
(අවම වශයෙන් වසර 02ක්වත් විදේශ රැකියාවක නිරත ව සිටි අය විය යුතු ය.)

ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතා සඳහා - ලකුණු 25
(රජය මඟින් හෝ රජය වෙනුවෙන් විදේශයක රාජකාරියක් ඉටු කිරීම සඳහා පත් කළ පුද්ගලයන් සඳහා)

ශිෂ්‍යත්වයක් සඳහා - ලකුණු 20
(නිරත වන රාජකාරියේ වෘත්තීය සංවර්ධනය සඳහා අවශ්‍ය වන)

**(උපරිම ලකුණු 40)**

III. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව

(6.3 II හි සඳහන් ලේඛන මඟින් පදිංචිය සනාථ කළ යුතු ය.)

පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දෙනු ඇත. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශය සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න පාසලක් වෙනුවෙන් ලකුණු 3.5 බැගින් අඩු කරනු ඇත.

(දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ දරුවාට ඇතුළත් වීමට හැකි ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ. එහෙත් ආගමික ප්‍රතිශතයක් අදාළ නොවන පාසල් සඳහා ඕනෑම ආගමක සිසුන්ට ඇතුළත් වීමට හැකිය.)

**(උපරිම ලකුණු 35)**

## 7.0 ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන්ට ලබා දී ඇති විශේෂ අනුග්‍රහය

7.1 ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ නිලධාරීන් තම දරුවන් පාසල්වලට ඇතුළත් කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හෝ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් හෝ අදාළ බලධාරීන් වෙත එවනු ලබන අයදුම්පත් අතරින් සුදුසු ළමයින් තෝරා ගැනීම සඳහා නිර්ණායක හා ලකුණු ක්‍රමයක් අදාළ අමාත්‍යාංශයන්හි ලේකම්වරු හා බලධාරීන් විසින් සකස් කර ඒ අනුව ළමයින් තෝරා ගනු ඇත. මෙහි දී ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිට ආබාධිත වූ සාමාජිකයන්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.

7.2 රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් හා නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් එක් පාසලක එක් සමාන්තර පන්තියක් සඳහා ළමයින් 05 දෙනෙක් බැගින් තෝරා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දීමෙන් අනතුරුව පාසල්වලට එම ළමයින් යොමු කරනු ඇත.

7.3 රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ හා නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ බලධාරීන් විසින් ලකුණු ක්‍රමයක් මත මෙම ළමයින් තෝරා පාසල් ලබා දීමේ කටයුතු සිදු කරන බැවින්, ඒ සම්බන්ධව පැන නගින ගැටලු නිරාකරණය කර ගත යුත්තේ එම අමාත්‍යාංශවල අදාළ බලධාරීන් මඟින් පමණක් ම බව අවධාරණය කර ගත යුතු ය.

## 8.0 ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

8.1 ළමයින් තෝරා ගැනීම සඳහා මව්පියන්/ නීත්‍යානුකූල භාරකරුවන් විසින් ළමයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත ද ඉල්ලුම්පතට අමුණන ලද ලිපි ලේඛනවල මුල් පිටපත් ද, ලබා දී ඇති ලකුණු ක්‍රමයට අනුකූල ව ලකුණු ලබා ගැනීම සනාථ කිරීම සඳහා අදාළ වන සියලු ලිපි ලේඛනවල මුල් පිටපත් ද ඉදිරිපත් කළ යුතු ය. මීට අමතර ව එම ලේඛනවල ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතු ය.

8.2 තමා විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවල නිරවද්‍යතාව, දිවුරුම් පෙත්සමක් මඟින් සහතික කළ යුතු ය.

8.3 ග්‍රාම නිලධාරී කාර්යාලය මඟින් සටහන් කර ලබා දුන් ඡන්ද හිමි නාම ලේඛනවල ලියාපදිංචි විස්තර මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති ඡන්ද හිමි නාම ලේඛන මඟින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ම සනාථ කර ගනු ඇත. ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය පිළිබඳ යම් ගැටලුවක් මතු වන අවස්ථාවන්හි දී මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් ම එය සනාථ කිරීම කර ගනු ඇත.

8.4 ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක් කූට ලේඛනයක් යැයි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැඟී යන්නේ නම්, එය නිකුත් කර ඇති ආයතනයෙන් හෝ බලධාරියාගෙන් විමසීමක් කොට එහි සත්‍ය අසත්‍යතාව තහවුරු කර ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිට සම්පූර්ණ බලය ඇත. එවැනි අවස්ථා ඇති වූ කල්හි ඒ පිළිබඳව අදාළ බලධාරියාට සුදුසු පරිදි කටයුතු කිරීමට දන්වා සිටිය හැකි ය. ඒ අනුව ඉදිරිපත් කර ඇති ලේඛනයක් හෝ ලේඛන, කූට ලේඛනයක් හෝ ලේඛන යැයි සනාථ වන්නේ නම් එවැනි ලේඛනයක්/ ලේඛන ඉදිරිපත් කිරීමට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

8.5 මෙම සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලේඛන හා අනෙකුත් තොරතුරු අනුව අයදුම්කරු අභිමුඛයේ දී ලකුණු ලබා දීමේ පත්‍රිකාවේ ලකුණු ඇතුළත් කරනු ලැබේ. එහෙත් වැරදි තොරතුරු/ කූට ලේඛන ලබා දී ඇති බව තහවුරු වුවහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට/ ලකුණු සංශෝධනය කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සම්පූර්ණ බලය ඇත.

## 9.0 තාවකාලික ලැයිස්තුව

9.1 ලකුණු ප්‍රමුඛතා මත එක් එක් ගණ සඳහා වෙන වෙන ම තෝරා ගැනීම සිදු කරන අතර, තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය සකස් කරනු ලැබේ.

9.2 තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛන ප්‍රසිද්ධ කිරීමට පෙර පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ තේරී ඇති ළමයින්ගේ පදිංචිය ස්ථානීය පරීක්ෂණය මඟින් තහවුරු කර ගනු ලැබේ.

ස්ථානීය පරීක්ෂණයේ දී පදිංචිය තහවුරු නොවේ නම් ලේඛනයෙන් නම ඉවත් කරනු ලබයි. අවශ්‍ය වන්නේ නම් අනෙකුත් ගණයන් ද ස්ථානීය පරීක්ෂණයට ලක් කළ හැකි ය.

9.3 ගණ කිහිපයකින් ඉල්ලුම් කළ ළමයකු ඉන් එක ගණයකට වඩා තේරී ඇති අවස්ථාවක දී එම එක් ගණයකින් හෝ තේරී පත් වීමට අවස්ථාවක් ඇත් නම් පමණක් එම ගණය යටතේ ළමයාගේ නම ඉතිරි කර අනෙකුත් ගණවල ලැයිස්තුවලින් ඉවත් කරනු ලැබේ.

9.4 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මඟින් තෝරා ගැනීමට නියමිත ළමයින්ගේ තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ අත්සනින් යුතු ව පාසල් දැන්වීම් පුවරුවේ සහ පාසලේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම විදුහල්පති විසින් සිදු කරනු ලබන අතර, එක් එක් අයදුම්කරුවන්ට පුද්ගලිකව දැනුම් දෙනු නොලබයි. එබැවින් මේ පිළිබඳව දෙමව්පියන්/ නිත්‍යානුකූල භාරකරුවන් විමසිලිමත්ව සිටීම අත්‍යවශ්‍ය වනු ඇත.

**10.0 අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීම.**

10.1 ප්‍රදර්ශනය කරන ලද තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය පාසල් දැන්වීම් පුවරුවේ සහ පාසලේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර සති 02ක් ඉකුත්වීමට පෙර, එම පාසලට අයදුම්කළ අයදුම්කරුවන් විසින් පමණක් එම ලේඛනවල යම් ස්ථානයක හිමිකම් නොලැබිය යුතු ළමයෙකුගේ නම අඩංගු වී ඇත්නම් ඒ පිළිබඳ විරෝධතාව හා/හෝ සුදුසුකම් තිබියදීත් තම දරුවාගේ නම නුසුදුසු තැනක ස්ථානගත ව ඇත්නම් ඒ පිළිබඳව අභියාචනයක් දැන්වීම් පුවරුවේ සහ පාසලේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරන ආකෘතියට අනුව, ලියාපදිංචි තැපෑලෙන් විදුහල්පති වෙත වහා ම ඉදිරිපත් කළ යුතු ය. ඒ සමඟ තම නම සහ ලිපිනය සඳහන් ලියාපදිංචි තැපැල සඳහා අවශ්‍ය මුද්දර සහිත ලියුම් කවරයක් ද එවිය යුතු ය. මෙම සති 02 ක කාල සීමාවෙන් පසු ව ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනයක් හෝ විරෝධතාවක් සලකා බලනු නොලැබේ.

10.2 විරෝධතා ඉදිරිපත් කිරීමේ දී සම්පූර්ණ ලැයිස්තුවට ම ඉදිරිපත් නොකොට නම් වශයෙන් සඳහන් කර ඉදිරිපත් කළ යුතු ය. මෙහි දී විරෝධයට ලක්වන ළමයා/ ළමයින්ගේ නම්, කැඳවීම් අංකය හා තම විරෝධය කෙටියෙන් ලියා දැක්වීම අවශ්‍ය වේ.

10.3 අභියාචනා හා විරෝධතා විමර්ශනය කිරීම සඳහා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයක් පත් කරනු ඇත. මෙම මණ්ඩලය මඟින් විරෝධතා ඉදිරිපත් කළ අය, විරෝධතාවයට ලක් වූ අය හා අභියාචනා ඉදිරිපත් කළ අය වෙන් වෙන් ව ප්‍රථම පරීක්ෂණයට ඉදිරිපත් කළ ලිපි ලේඛන මඟින් නැවත විමර්ශනයට ලක් කරනු ඇත. එසේ ම විරෝධතා පරීක්ෂාවේ දී විරෝධතාවට ලක් වූ ළමයාගේ මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් කැඳවා පරීක්ෂා කර තීරණයකට එළඹීමට පෙර ඔවුන්ට කරුණු පැහැදිලි කර ගැනීමට අවස්ථාවක් ලබා දෙනු ඇත.

10.4 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් අභියාචනා හා විරෝධතා පරීක්ෂා කර සනාථ කිරීමෙන් පසු ව සුදුසුකම් අනුව (ලකුණු ප්‍රමුඛතා මත) අභියාචනාකරුවන් හා විරෝධතාවයට ලක් වූ/ දැක් වූ අයදුම්කරුවන් තාවකාලික ලැයිස්තුවේ නිසි තැනට ඇතුළත් කොට සංශෝධිත තාවකාලික ලැයිස්තුව සකස් කරනු ඇත.

10.5 එක් එක් ගණය අනුව සංශෝධනය කරන ලද තාවකාලික ලැයිස්තුවෙන් පාසලට ඇතුළත් කර ගත හැකි සංඛ්‍යාව අනුව ඉහළ ම සිටින අය තෝරා ගෙන අවසන් ලේඛනය සකස් කරනු ලැබේ.

10.6 තාවකාලික හා අවසන් ලේඛනයන්හි දී යම් ගණයක තෝරා ගත යුතු සංඛ්‍යාව සම්පූර්ණ වන අවසන් ස්ථානයට හිමි ලකුණේ, සම ලකුණු ලැබූ ළමයින් කිහිප දෙනෙකු සිටින අවස්ථාවක දී පාසලට ඇති ආසන්නතාව අනුව පෙළගස්වා, තෝරා ගත යුතු ය. එක් එක් ගණයන්ට වෙන වෙන ම ලකුණු ලබා දුන්න ද ආසන්නතාව අනුව ලකුණු ලබා දීම වඩා සාධාරණ බැවින්, මෙවැනි අවස්ථාවක පාසලට ඇති ආසන්නතාව අනුව (දුර අනුව) පෙළ ගැස්වීම සිදු කළ යුතු ය.

10.7 අභියාචනා හා විරෝධතා පරීක්ෂණයෙන් පසු ව ළමයින් තෝරා ගැනීමේ අවසාන ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සාමාජිකයන්ගේ අත්සන් සහිත ව පාසල් දැන්වීම් පුවරුවේ සහ පාසලේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරනු ඇත.

10.8 අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කරන ලද යම් අයදුම්කරුවෙකු පිළිබඳ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය වේ. යම් හෙයකින් විරෝධතාවකට ලක් වූ ළමයාගේ මව්පියන් නිත්‍යානුකූල භාරකරුවන් විධිමත්ව දැනුම් දී තිබිය දීත් විරෝධතා විභාගය සඳහා නොපැමිණියේ නම් විරෝධතාව පිළිබඳ ඒක පාර්ශ්වික තීරණ ගැනීමට අභියාචනා හා විරෝධතා මණ්ඩලයට හැකි ය.

10.9 දෙමව්පියන්/නිත්‍යානුකූල භාරකරු විසින් ඉල්ලුම් කරන ලද පාසල් කිහිපයකට තම ළමයා තේරුණු අවස්ථාවේ දී දෙමව්පියන්/ නිත්‍යානුකූල භාරකරු විසින් තම අයදුම්පත්‍රයෙහි පාසල් ඉල්ලුම් කරන ලද ප්‍රමුඛතා අනුපිළිවෙල සළකා බලා ප්‍රමුඛතාව වැඩි පාසලේ ලැයිස්තුවේ ළමයාගේ නම ඉතිරි කර අනෙකුත් තේරුණු පාසල් ලැයිස්තුවලින් ළමයාගේ නම ඉවත් කරනු ලැබේ.

10.10 ඉන් පසු ව තේරුණු හා නොතේරුණු අයදුම්කරුවන්ට ඒ පිළිබඳව සඳහන් කර විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව ලිපියක් මඟින් දැනුම් දෙනු ලැබේ. තෝරාගත් ළමයින් අතුරින් කිසියම් ළමයකු ඇතුළත් කිරීමට නියමිත දින සිට සති 2ක් තුළ, පාසලට ඇතුළත් නොකරන්නේ නම්, එම ළමයා පාසලට ඇතුළත් නොකරන ළමයකු සේ සළකා අදාළ පුරප්පාඩුව පොරොත්තු ලේඛනයෙන් සම්පූර්ණ කරනු ලැබේ.

10.11 පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත්කිරීම සඳහා ළමයාද සමඟ පැමිණීම අනිවාර්ය වේ.

10.12 පළමුවන ශ්‍රේණිය සඳහා සිසුන් තෝරා ගැනීම කාල රාමුවකට අනුව සිදු කරනු ලබයි. තෝරා ගත් ළමයින් 2024 පළමු වන පාසල් වාරය ආරම්භයේදී පාසල්වලට ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත.

## 11.0 තෝරා නොගත් ළමයින්ට පාසල් ලබා දීම.

අයදුම්කරු විසින් ඉල්ලුම් කරන ලද පාසල් අතුරින්, තේරී ඇති පාසලකට දරුවා ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු අතර, කිසිම පාසලකට තෝරා නොගත් ළමයකුගේ මව/පියා/ නිත්‍යානුකූල භාරකරු විසින් තම දරුවාට විකල්ප පාසලක් ලබා ගැනීම සඳහා අනිවාර්යයෙන්ම මසක් ඇතුළත තමන් පදිංචි ප්‍රදේශයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට නව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

ඒ අනුව, සෑම දරුවෙකුට ම පාසල් ලබා දීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් සිදු කරනු ඇත.

## 12.0 ළමයින් ඇතුළත් කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම තහනම් කිරීම.

සියලු ම රජයේ පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම වෙනුවෙන් පහසුකම් හා සේවා ගාස්තු සහ පාසල් සංවර්ධන සමිති සාමාජික මුදල හා සියලු ළමයින්ගෙන් අයකර ගැනීමට පාසල විසින් අනුමත කර ගෙන ඇති මුදල හැර ඍජුව ම හෝ වක්‍ර ව වෙනත් ගාස්තු හෝ ආධාර මුදල් හෝ වෙන යම් බඩු බාහිරාදියක් හෝ පාසලට/ පාසලට සම්බන්ධ සංවිධානවලට/ තුන්වන පාර්ශ්වයකට ලබා දීම සපුරා තහනම් වේ. ළමයින් ඇතුළත් කිරීමෙන් පසු ව ද එසේ ලබා දීමක් සිදු නොකළ යුතු ය. එසේ සිදු කරන්නේ නම් එය නීති විරෝධී කටයුත්තක් වන අතර දඬුවම් ලැබිය හැකි වරදක් බව ද සලකන්න.

මෙම පුවත්පත් නිවේදනයේ සඳහන් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යාපන ලේකම් සතුය.

**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**2023.07.13**